ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
University of Sri Jayewardenepura
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
External Degrees and Extension Courses Unit

මගේ අංකය / My Number: USJP/ EEX - 15
ඔබේ අංකය / Your Number:
දුරකථනය / Telephone: 011-2801481, 011-3132496, 011-2803550
ෆැක්ස් / Fax: 011-2802753
වෙබ් අඩවිය / Website: www.external.sjp.ac.lk
විද්‍යුත් තැපැල / E-mail: info.ext@sjp.ac.lk

2024-09-19

ගරු ස්වාමීන් වහන්ස/ මහත්මයාණනි/ මහත්මියනි/ මෙනෙවියෙනි

## 2018 ශාස්ත්‍රවේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව ශිෂ්‍ය ලියාපදිංචිය දීර්ඝ කිරීම

2018 අධ්‍යයන වර්ෂය සඳහා ශාස්ත්‍රවේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වු ඔබගේ එම ලියාපදිංචි කාල සීමාවට අදාළ සියලුම පරීක්ෂණ දැනට පවත්වා අවසන් කර ඇත. ඒ අනුව 2018-09-01 සිට 2021-08-31 දක්වා වු ප්‍රථම ලියාපදිංචි කාල සීමාව තුල ඔබට උපාධිය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී තිබේ නම් හා තවදුරටත් පුනර් අපේක්ෂකයෙකු ලෙස අධ්‍යයන කටයුතු කරගෙන යාමට අවශ්‍ය වන්නේ නම් එම ලියාපදිංචිය දීර්ඝ කර ගත යුතුය.

එසේම පරීක්ෂණ සඳහා අයදුම් කිරීමට පෙර ලියාපදිංචිය දීර්ඝ කර තිබීම අනිවාර්ය වේ. ඒ සඳහා නියමිත අයදුම්පත සහ මුදල් ගෙවිය යුතු ගිණුම් අංකය අප වෙබ් අඩවියෙහි https://external.sjp.ac.lk/bachelor-of-arts-general-external-degree-registration-renewals/ හරහා ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය යෙදීමෙන් බාගත (Download) කරගත හැකිය. ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් ගෙවීම් කළ හැක. ලියාපදිංචිය දීර්ඝ කිරීම සඳහා එක් එක් අයදුම්කරුවන් වෙනුවෙන් වෙන වෙනම ගිණුම් අංක ලබා දී ඇති බැවින් ඔබට අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කල යුතුය.

එම අයදුම්පත සමඟ නියමිත ගාස්තු ගෙවීමෙන් අනතුරුව ලබා ගන්නා රිසිට්පත සහ ශිෂ්‍ය වාර්තා පොත නියෝජ්‍ය ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ **"ලියාපදිංචිය දීර්ඝ කිරීම - 2018 ශාස්ත්‍රවේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව"** යනුවෙන් සඳහන් කළ යුතුය.

❖ **ලියාපදිංචිය දීර්ඝ කිරීමේ ගාස්තු - එක් වසරක් සඳහා රු. 5000.00**

පවත්නා නිර්ණායක අනුව පහත පරිදි ඔබගේ ලියාපදිංචිය දීර්ඝ කල හැක.

| ලියාපදිංචිය | *ලියාපදිංචි වලංගු දිනය* | ලියාපදිංචි ගාස්තුව |
|---|---|---|
| ලියාපදිංචිය දීර්ඝ කිරීම - I | 2021.09.01 – 2022.08.31 | රු. 5000.00 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම - II | 2022.09.01 – 2023.08.31 | රු. 5000.00 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම - III | 2023.09.01 – 2024.08.31 | රු. 5000.00 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම - IV | 2024.09.01 – 2025.08.31 | රු. 5000.00 |

**සැලකිය යුතුයි**

- *ඉදිරියට පවත්වන පුනර් පරීක්ෂණ සඳහා අයදුම් කරන්නේ නම් ඒ සඳහා අයදුම් කිරීමට ප්‍රථම **එක් එක් පරීක්ෂණයට අදාළව පළ කෙරෙන විස්තර පත්‍රිකාවේ එම පරීක්ෂණය සඳහා ඔබගේ කණ්ඩායමට අදාළව තිබිය යුතු ලියාපදිංචි වලංගු දිනය** දැක්වෙන අතර අප වෙබ් අඩවියෙන් අයදුම්පත බාගත කරගෙන රු. 5000.00 මුදල ගෙවා ලියාපදිංචිය දීර්ඝ කරගත යුතුය.*

- *පාඨමාලා වාරික ගෙවීමේ අයදුම්පත්, සම්මන්ත්‍රණ කාලසටහන්, පරීක්ෂණ කාලසටහන්, විභාග ප්‍රවේශ පත්‍ර සහ සියලුම විස්තර වෙබ් අඩවිය ඔස්සේ පමණක් නිකුත් කරනු ලබයි. **දිනපතා වෙබ් අඩවිය පරිශීලනය කිරීම අනිවාර්ය වේ. තැපැල් මඟින් ලිපි එවනු නොලැබේ.***

නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2024-09-19